// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2382/35 - 2024 මැයි මස 03 වැනි සිකුරාදා - 2024.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ, ම විසින් 2022 ජූලි මස 22 දිනැති අංක 2289/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය වරින්වර සංශෝධනය කරන ලදුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් 2024 මැයි මස 03 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2024 මැයි මස 03 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි "අංක 01. ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි III වැනි තීරුවෙහි "ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13)" අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

- ජාතික ජල ශාස්ත්‍රීය පනත (2024 අංක 7)

1A - G 41871 — 359 (2024/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එම නිවේදනයෙහි "අංක 04. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි පහත අයිතමය ඉවත් කිරීමෙන් ;

11. පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම

(3) එම නිවේදනයෙහි ''අංක 09. අධ්‍යාපන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 50. අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන් ;

51. පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 51 සහ 52 අයිතමයන් පිළිවෙලින් අංක 52 සහ 53 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

EOG 05 - 0026

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.